# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2359/55 - 2023 නොවැම්බර් මස 24 වැනි සිකුරාදා - 2023.11.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

ඉඩම් අමාත්‍යාංශ ගොනු අංකය : 4-3/7/2020/hw/212.
මගේ අංකය: 3/6/2019/9/ADI/1.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය :-

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 888 දෙවටේගෙදර වසමේ පිහිටි සර්වේ ජනරාල් විසින් මැන සකස් කරන ලද මු.පි. කු 2527 හා 2022.11.30 දිනැති මූලික පිඹුරේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ල :

01. **කැබලි අංක 1**

ඉඩමේ නම : පිංකුඹුර; මුල් හිමිකම් කියන අය : අල්ගම ශ්‍රී සංඝරාජ රජමහ විහාරය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0922.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 දෙසැම්බර් මස 27 වැනි දින පෙ.ව. 10.00ට පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2023 දෙසැම්බර් මස 13 දිනට මත්තෙන් එම ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඩී. අනෝමා දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
පොල්ගහවෙල.

2023 නොවැම්බර් මස 16 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 11-0276